විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. TCM/F/MTF/SPR/18/124 ඔබේ අංකය / உமது இல. / Your No. 
දිනය / திகதி / Date 2018 සැප්තැම්බර් 07 දින

11 SEP 2018

සභාපති,

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල.

**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අයෝජන කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කරන ලද විශේෂ විගණන වාර්තාව**

---

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අයෝජන කළමනාකරණය සම්බන්ධයෙන් විගණකාධිපති විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂිත විශේෂ විගණන වාර්තාවේ කෙටුම්පතක් මේ සමග ඉදිරිපත් කරමි.

02. මෙහි සඳහන් කරුණු පිළිබඳව ඔබගේ අදහස් මෙම ලිපියේ දින සිට දින 05 ක් ඇතුළත දන්වා එවන ලෙසද,

03. මේ පිළිබඳව වැඩිදුරටත් සාකච්ඡා කළ යුතු කරුණු වේ නම් එම සාකච්ඡාවේදීම අවසාන තීරණයකට එළඹීමේ එකඟත්වය ඇතිව ඒ සඳහා දින තුනක් ඇතුළත දිනයක් ලබා ගන්නා ලෙසද,

04. ඉහත 02 හි හා 03 හි සඳහන් පරිදි කටයුතු කිරීමට අපහසු වේ නම් ඒ බව ලිඛිතව දැනුම්දීමට කටයුතු කරන මෙන්ද,

05. එසේ පිළිතුරක් නොලද හොත් කෙටුම්පත් වාර්තාවේ සියළු කරුණු සම්බන්ධයෙන් එකඟ වුවා සේ සලකා අවසාන වාර්තාව නිකුත් කිරීමට සිදුවන බවද දන්වමි.

කේ.කේ.වී.ධර්මසිරි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : ලේකම්, ජනාධිපති අරමුදල

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

11 SEP 2018

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ආයෝජන කළමනාකරණය සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව

---

## 1. විධායක සාරාංශය

යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සලසාදීමේ මූලික අරමුණින් රු.10,000 ක පෞද්ගලික ධන පරිත්‍යාගයකින්, 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනත යටතේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පිහිටුවා ඇත. එය විවිධ පරිත්‍යාගවලින් වර්ධනය වූ, ස්වාධීන භාරකාර මණ්ඩලයකින් පාලනය වන ජනතාවගේ අරමුදලකි. පනතේ 6 (1) අනුව අරමුදලේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමේලා අවශ්‍ය හිතකර වන හෝ අනුශාංගික වන සියලු දේ කිරීමේ බලය අරමුදලේ නාමයෙන් භාරකාර මණ්ඩලයට ලැබී තිබුණි. තවද වඩාත් වාසි සැලසෙන පරිදි භාර අරමුදල් උත්පාදනය හා කළමනාකරණය කිරීම භාරකරුවන් විසින් කළයුතු වේ. භාරකාර මණ්ඩලය ප්‍රාරම්භක, අග්‍ර විනිශ්චකාරවරයා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්, අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශ ලේකම්, වෙළඳ අමාත්‍යාංශ ලේකම් හා ප්‍රාරම්භක විසින් පත්කරනු ලබන පුද්ගලයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. ප්‍රාරම්භකගේ මරණයෙන් පසු වෙළඳ විෂයභාර අමාත්‍යවරයා ප්‍රාරම්භක ලෙස අදහස් කෙරේ. පසුගිය කාල පරිච්ඡේදය තුළදී භාරකාර මණ්ඩලය විසින් ගෙන තිබූ තීරණ මහපොළ අරමුදලට හිතකර හා වාසිදායක නොවන අයුරින් බලපා තිබුණි. එනම් විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි ශිෂ්‍යයන් හට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපනයට අවස්ථාව ලබාදීමේ අරමුණින් මහපොළ භාර අරමුදලට අයත් මාලබේ පිහිටි අක්කර 25 ක ඉඩමක, මහපොළ අරමුදලින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) සමඟ 2003 මාර්තු 19 දින එළඹ තිබූ ගිවිසුමෙන් මහපොළ භාර අරමුදලට තිබූ වාසිදායක කොන්දේසි 2005 නොවැම්බර් 14 දින හා 2015 මැයි 12 යන දිනවල එළඹි ගිවිසුම් මඟින් ඉවත්කර මහපොළ භාර අරමුදලට SLIIT ආයතනය සම්බන්ධයෙන් තිබූ අයිතිය බදුකුළී ගිවිසුමක තත්ත්වයට පත්කර තිබූ අතර එතෙක් ලැබිය යුතුව තිබූ ආදායම් මහපොළ අරමුදල වෙත ලබාදී නොතිබුණි. තවද ජනාධිපති අරමුදල හා මහපොළ භාර අරමුදලේ සම ප්‍රාග්ධන දායකත්වයෙන් පිහිටුවා තිබූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් සියයට 50 ක හිමිකමක් මහපොළ භාරකාර අරමුදලට තිබුණද 2012 වර්ෂයේ සිට ඊට අඩු ලාභ කොටසක් ලැබී තිබුණි. භාර අරමුදලින් පිහිටවූ නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් කළමනාකරණය කරන ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන මහපොළ භාර අරමුදලේ ආයෝජන කළඹ කළමනාකරණය කිරීම අධීක්ෂණය නොකිරීමෙන් සහ එම සමාගමේ පරිපාලිත සමාගමක් වන නැට්වෙල්ත් සිකියුරිටීස් ආයතනය විසින් සිදුකරනු ලබන රජයේ සුරැකුම්පත් ගණුදෙනු සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් නොකිරීම නිසා එම සමාගම් පසුගිය කාල පරිච්ඡේද වලදී පාඩු ලබමින් හෝ ප්‍රමාණවත් ලාභ නොලබමින් පැවතුණි. තවද අරමුදල් රැස්කර ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ලොතරැයිකරුවකු තෝරාගෙන සිදුකර තිබූ මංගත ලොතරැයිය තුළින් උපයාගත් ලාභ භාර අරමුදල වෙත ලැබී නොතිබුණි. මෙම කරුණු අනාවරණය කිරීම තුළින් මහපොළ අරමුදලට බලපා ඇති අහිතකර තත්ත්වයන් සඳහා වගකිව යුතු පාර්ශවයන් පෙන්වා දී, භාර අරමුදල පිහිටුවීමේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වඩාත් වාසිදායක නිවැරදි ආයෝජන තීරණ ගැනීමට වගකිවයුතු පාර්ශවයන් යොමු කරවීම මෙම වාර්තාව නිකුත් කිරීමේ පරමාර්ථය වේ.

11 SEP 2018

## 2. උක්ත වාර්තාව නිකුත් කිරීමේ පසුබිම හා නෛතික විධිවිධාන

### 2.1 නෛතික විධිවිධාන

භාර අරමුදලේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහාද අරමුදලේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහාද අවශ්‍ය සියලු ගිවිසුම්වලට එළඹීම සඳහාත් අරමුදලේ ස්වකීය සේවා නියුක්තිකයින්, නිලධාරීන්, සේවකයින් පත්කිරීමත්, උසස් කිරීම, පාරිශ්‍රමික ගෙවීම, විනය පාලනය කිරීම, නිවාඩු දීම හා වෙනත් ප්‍රතිලාභ සැලසීම පිළිබඳ රීති සෑදීම සහ ශිෂ්‍යත්ව හෝ කිසියම් පහසුකමක් පිරිනැමීම හෝ ප්‍රදානය කිරීම පිළිබඳ නියමයන් කරමින් රීති හා අතුරු ව්‍යවස්ථා සෑදීමත් 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත යටතේ භාරකාර මණ්ඩලයට බලය පැවරී ඇත.

තවද නීතිපති විසින් නිකුත් කළ අංක ඊ/21/2003 හා 2003 ජූනි 24 දිනැති ලිපියෙන් භාර අරමුදලට රජයේ නීතිරීති අදාළ නොවන බව දන්වා ඇති බැවින් රජයේ මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හෝ රජයේ වරින්වර නිකුත්කරනු ලබන චක්‍රලේඛවලට අනුව භාර අරමුදල කටයුතු නොකෙරෙන අතර සියලු කටයුතු භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත සිදුකෙරේ.

### 2.2 පසුබිම

ශ්‍රී ලංකාවේ පවත්නා දරිද්‍රතාවය පිළිබඳ ගැටළුවලින් අත්මිදීමේ මාර්ගයක් ලෙස අධ්‍යාපනය නංවාලීම අවශ්‍ය බව අවබෝධකර ගත් ප්‍රාරම්භක 1980 දී අගහිඟකම්වලින් පෙළෙන තැනැත්තන්ට සහන සැලසීම උදෙසා මහපොළ වැඩසටහන ගම්බද ප්‍රදේශවල ආරම්භකරන ලදී. එහි ඉදිරි පියවරක් ලෙස රජයේ සහ මහජනයාගෙන් මුදල් ලබාගෙන වරප්‍රසාද නොලත් යෞවනයනට උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ ද්විතීය අධ්‍යාපනය සතුටුදායක ලෙස සම්පූර්ණ කර සිටින ආධාර ලැබීමට සුදුසු යෞවනයින්ට උසස් අධ්‍යාපන ආයතනයකදී සිය අධ්‍යාපනික,කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා හා වෘත්තීය ප්‍රවීණතා සහ නිපුණතා වැඩිදියුණුකර ගැනීම සඳහා ආධාර සැලසීමේ අරමුණින්, 1981 අංක 66 දරන පනතින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පිහිටුවන ලදී. එහි උත්පාදනය කළමනාකරණය කිරීම පිණිස භාරකරුවන් ලෙස ක්‍රියාකිරීමට එකහට භාරකරුවන් පත්කර තිබුණි. එසේ වුවද භාර අරමුදලේ වත්කම් නිසිපරිදි කළමනාකරණය නොකිරීම හා සිදුවෙමින් පවතින අහිතකර තත්වයන් හේතුවෙන් ලැබිය යුතු හා ලබාගත හැකිව තිබූ ප්‍රතිලාභ ලබා නොගැනීම නිසා, මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් උසස් අධ්‍යාපන කටයුතුවල යෙදීමට නොහැකිව සිටින සිසුන් වැඩි පිරිසකට සහන සැලසීමට තිබූ

11 SEP 2018

ඉඩ ප්‍රස්ථා මේ නිසා අහිමිකරගෙන තිබෙන අතර අරමුදල සතු වත්කම්වල පැවැත්මටද ඉන් බලපෑම් ඇතිවී තිබේ. මෙම කරුණු අනාවරණය කිරීම තුළින් ඊට රජයේ මැදිහත්වීම හා අරමුදලේ වැඩි වාසි උසස් අධ්‍යාපනයේ නියුතු මූල්‍ය දුෂ්කරතා සහිත සිසුන්ට ලබාදිය හැකිවන පරිදි නිවැරදි තීරණ ගැනීම සඳහා වගකිවයුතු පාර්ශවයන් යොමුකරවීමත් අපේක්ෂා කෙරේ.

**3. මෙම වාර්තාව පිළියෙල කිරීමේදී පහත දැක්වෙන ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී**

**3.1 ලේඛන, පොත්පත් හා වාර්තා පරීක්ෂා කිරීම**

3.1.1 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත

3.1.2 අමාත්‍ය මණ්ඩල සංදේශ සහ තීරණ

3.1.3 භාර මණ්ඩල තීරණ

3.1.4 භාර අරමුදල එක් එක් ආයෝජකයන් සමඟ ඇති කර ගන්නා ලද පහත ගිවිසුම්

3.1.4.1 2003 මාර්තු 19 දින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම සමඟ

3.1.4.2 2005 නොවැම්බර් 14 දින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම සමඟ

3.1.4.3 2015 මැයි 12 දින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම

3.1.4.4 2003 නොවැම්බර් 18 දින නැෂනල් වෙල්ත් කොපරේෂන් සමාගම සමඟ

3.1.4.5 2013 ජූලි 30 දින ඕෂනික් ගේම්ස් (පෞද්) සමාගම සමඟ

3.1.5 භාර අරමුදල ගනුදෙනු කරනු ලබන සමාගම්වල සංස්ථා ප්‍රකාශ, සාංගමික ව්‍යවස්ථා හා සමාගමේ අධ්‍යක්ෂවරුන්, භාරකරුවන්, ලේකම්වරුන් හා කොටස්කරුවන් සම්බන්ධ තොරතුරු

3.1.6 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තා

3.1.7 උපයෝගි පොත් හා මූලාශ්‍ර ලියවිලි

3.1.8 ස්ථාවර තැන්පතු සහතික පත්‍ර

3.1.9 භාණ්ඩාගාර බැඳුම්කර

3.1.10 භාණ්ඩාගාර බිල්පත්

3.1.11 අතිවිශේෂ ගැසට් පත්‍ර සහ පුවත්පත් ලිපි

DRAFT

11 SEP 2018

3.1.12 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය (2006), ප්‍රසම්පාදන අත්පොත සහ එහි සංශෝධනයන්

3.1.13 ප්‍රසම්පාදන කමිටු වාර්තා හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා

3.1.14 ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ලංසු පත්‍ර හා ලේඛන අඩංගු ලිපි ගොනු

3.1.15 අන්තර්ජාලය හා වෙබ් අඩවි

## 4 විෂය පථය සීමාවීම

මෙම වාර්තාවේ දැක්වෙන නිරීක්ෂණයන් තුළින් නිගමනයන්ට එළඹීමේදී මතු දැක්වෙන විෂය පථය සීමා කිරීම් වලට යටත්ව සිදුකළ බව අවධාරණය කරනු ලැබේ.

4.1 භාර අරමුදල විසින් විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම

4.2 2012 වර්ෂය සඳහා ඉදිරිපත්කළ ඒකාබද්ධ ගිණුම්වලට අදාළ වැඩ පත්‍රිකා හා 2013, 2014, 2015, 2016, 2017 වර්ෂවල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම.

4.3 මහපොළ අරමුදලට ලැබී ඇති පරිත්‍යාග හා ප්‍රතිලාභ පිළිබඳ ඇතැම් තොරතුරු ඉදිරිපත් නොකිරීම.

## 5 ක්‍රියාවලිය

මහපොළ භාරකාර අරමුදලේ දැක්ම, මෙහෙවර හා අරමුණු පහත දැක්වේ.

### දැක්ම

දිළිදුකම තුරන් කිරීම ඉලක්ක කර ගත් වියත් සමාජයක් බිහිකිරීම

### මෙහෙවර

වරප්‍රසාද නොලත් යෞවනයනට උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් පහසුකම් නංවාලීම මඟින් සම අවස්ථා ඇති කිරීම.

11 SEP 2018
MAHAPOLA H

අරමුණු හා පරමාර්ථ

------------------------

(අ) යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම

(ආ) ද්වීතියන අධ්‍යාපනය සතුටුදායක ලෙස සම්පූර්ණ කර සිටින අධාර ලැබීමට සුදුසු යෞවනයින්ට උසස් අධ්‍යාපන ආයතනයකදී සිය අධ්‍යාපනික, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපනික කටයුතු සපුරා ගැනීම සඳහා උපකාර වන ආධාර සැපයීම.

(ඇ) තරුණයින්ගේ හැකියා දියුණු කිරීම සඳහා වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම හා ඒවායෙහි කළමනාකරණයට සහය වීම


(ඇ) අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරත වන පාසල් සහ ආයතන ආදිය පිහිටු වීම හා ඒවා කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාමට සහය වීම

(ඉ) අධ්‍යාපනය සැලසීමෙහි ලා නිරතව සිටින කතිකාචාර්යවරුන්ගේ ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැලසීම

ප්‍රාරම්භකගෙන්, රජයෙන් හා මහජන මුදලින් ගොඩනැගුණු භාර අරමුදල වඩාත් වාසිදායක ලෙස ආයෝජනය කිරීමෙන් උපයා ගන්නා ආදායම් අරමුදලේ ඉහත අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කාර්යයන් වෙනුවෙන් වැයකර අධ්‍යාපනයේ නියුතු මූල්‍ය දුෂ්කරතා හා අඩු පහසුකම් ඇති ශිෂ්‍යයන් හට වඩාත් ප්‍රතිලාභ අත්කර දීමට හැකිවන පරිදි කටයුතු සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ කාර්යභාරය වන අතර ඒ සඳහා භාර අරමුදල සතු වත්කම් පහත පරිදි ආයෝජනය කර තිබුණි.

DRAFT

11 SEP 2018




## 5.1 ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම පිහිටුවීම

5.1.1 තොරතුරු තාක්ෂණය පිළිබඳව ආයතනයක් පිහිටුවීම යන මැයෙන් අභ්‍යන්තර හා අන්තර්ජාතික වාණිජ කටයුතු හා ආහාර අමාත්‍යවරයා සහ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ ඒකාබද්ධ සංදේශයට 1998 ජූලි 08 දිනැති අංක 98/995/11/052 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලබාගෙන තිබුණු අතර ඒ අනුව,

5.1.1.1 මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට අයත් කොළඹ දිස්ත්‍රික්කයේ මාළඹේ ප්‍රදේශයේ පිහිටි අක්කර 25 ක භූමිය තොරතුරු තාක්ෂණ ආයතනය ඉදිකිරීම සඳහා යොදාගැනීමට

5.1.1.2 රු.500,000,000 ක උපරිමයකට යටත්ව මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යනය කිරීමට

5.1.1.3 මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල,යෝජිත තොරතුරු තාක්ෂණය ආයතනයේ ස්වාධීන පාලන මණ්ඩලයේ නියෝජ්‍යත්වය දැරීමට යෝජනා වී තිබුණි.

11 SEP 2018

5.1.2 ඒ අනුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ "ශ්‍රී ලංකා" යන නාමය ද ඇතුළත් කරමින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම, 1999 මාර්තු 26 දින ඇපයෙන් සීමිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී. මෙහි දී ඇමුණුම 01 හි සඳහන් භාරකරුවන් නිල බලයෙන් පත් වී තිබුණි. අදාළ ඇපකරුවන් පුද්ගලයන් වශයෙන් වෙනස් වුවද එම තනතුරට පත්වන නිලධාරියා නිලබලයෙන් මෙම සමාගමේ භාරකරුවන් වශයෙන් පත් විය යුතු වුවද 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වීමේදී එම භාරකරුවන් ඇමුණුම 02 හි පරිදි වෙනස් වී තිබුණි.

5.1.3 විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි ශිෂ්‍යයන් හට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපන දොරටු විවර කිරීම මෙම ආයතනය පිහිටු වීමේ මූලික අරමුණ වූ අතර මෙම ආයතනය පිහිටුවීමට මූලික වූ අභ්‍යන්තර, අන්තර්ජාතික වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සහ ආහාර හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අමාත්‍යවරුන් විසින් 1998 ජූලි 01 දින ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ සංදේශය මඟින් ඊට අවශ්‍ය අරමුදල් සම්පාදනය කරමින් සම්පත් දායකත්වය සැපයීමේ වගකීම මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට පවරා තිබුණි.

5.1.4 භාර අරමුදල, භාර අරමුදලට අයත් කොළඹ දිස්ත්‍රික්කයේ මාළඹේ ප්‍රදේශයේ පිහිටි අක්කර 25 ක භූමිය තුළ "මහපොළ කැම්පස්" නමින් අධ්‍යාපන ආයතනයක් පිහිටුවා තිබුණි. එහි කළමනාකාරණය සඳහා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගමෙන් සේවය ලබා ගැනීමට භාර අරමුදල හා එම සමාගම අතර අවුරුදු 8 ක කාල සීමාවකට 2003 මාර්තු 19 වන දින නෛතික ගිවිසුමකට දෙපාර්ශවය එළඹ තිබුණි. එම ගිවිසුම් කාල සීමාව ඉක්මවීමට පෙර එනම් 2005 නොවැම්බර් 14 දින නැවත භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම අතර ගිවිසුමකට එළඹ ඇති අතර එහි දී මුල් ගිවිසුමෙන් භාර අරමුදල සමඟ එකඟවී තිබූ වාසිසහගත වූ පහත සඳහන් කොන්දේසි ඉවත් කර තිබුණි.

5.1.4.1 4 (ඉ) වගන්තිය - SLIIT ආයතනයේ වෙනත් ශාඛාවන් හෝ භාර අරමුදලෙහි අරමුණුවලට අනුකූල නොවන වෙනත් කිසිඳු වාණිජ අරමුණක් වෙනුවෙන් මහපොළ විශ්ව විද්‍යාලයේ සියලුම වත්කම් හා ආදායම් ඍජුව හෝ වක්‍රව යොදා නොගත යුතු බව

5.1.4.2 4(ඌ) වගන්තිය - විශ්ව විද්‍යාලයේ අභිවෘද්ධිය උදෙසා කරනු ලබන සියලු කටයුතු භාර අරමුදලේ එකඟතාවය මත සිදුකළ යුතු බව

11 SEP 2018

5.1.4.3 4(එ) වගන්තිය - අධ්‍යාපන පාඨමාලා පැවැත්වීමෙන් ලබන ආදායම් එකතුකිරීම හා විශ්ව විද්‍යාලයේ ශුභ සිද්ධිය උදෙසා අවශ්‍ය වියදම් දැරීම SLIIT ආයතනයේ වගකීමක් බව

5.1.4.4 4(ඔ) වගන්තිය - විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් වූ සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ කිරීමේ අයිතිය භාර මණ්ඩලයට නියම වන බව

5.1.4.5 4(ඖ) වගන්තිය - එකඟ වූ කළමනාකරණ ගාස්තුව අඩුකිරීමෙන් පසු විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරකම් තුළින් ජනිත වන ආදායම්හි අතිරික්තය ඊළඟ වර්ෂයේ ජුනි 30 දිනට පෙර භාර අරමුදලට බැර කළ යුතු බව හා භාර අරමුදලෙහි භාර මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව අනිකුත් ආයෝජනයන් නොකළ යුතු බවය. එසේ වුවද විශ්ව විද්‍යාලයේ අනාගත සංවර්ධනය සඳහා සංචිත ගිණුමක් පවත්වාගෙන යාමට SLIIT හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාර අරමුදලෙහි භාර මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටිය හැකි අතර එවැනි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් භාර අරමුදල විසින් මෙම සංචිත ගිණුමෙන් ලබා දිය හැකි බව

5.1.4.6 4(ක) වගන්තිය - විශ්ව විද්‍යාලය පිහිටුවීමේ අරමුණ සඳහා භාර අරමුදල විසින් ජාතික සංවර්ධන බැංකුවෙන් (NDB) සැලකිය යුතු ණය මුදලක් ලබාගෙන ඇති බවට SLIIT ආයතනය අවබෝධ කරගත යුතු බවත් ආයතනය මූල්‍ය ශක්‍යතාවයෙන් හෙබි විට වාරික ගෙවීම සඳහා වූ සෑම ප්‍රයත්නයකටම SLIIT ආයතනය සහතික වන බව

5.1.4.7 4(ච) වගන්තිය- විශ්ව විද්‍යාලයේ කළමනාකරණය හා ගිණුම් පරීක්ෂාව හා අගය කිරීම සඳහා දක්ෂ කළමනාකරුවන් හා විගණකයන්ගෙන් සමන්විත ස්වාධීන පුද්ගල කණ්ඩායමක් පත්කිරීමේ අයිතිය හා අලුතෙන් හඳුන්වාදිය හැකි නව පාඨමාලා පිළිබඳ ඇගයීම සඳහා සුදුසුකම් ලත් උගතුන් හා දක්ෂ පුද්ගලයන්ගෙන් සමන්විත කණ්ඩායමක් පත් කිරීමේ අයිතිය භාර මණ්ඩලය සතු වන බව

5.1.4.8 4(ඩ) වගන්තිය - භාර මණ්ඩල තීරණයට අනුව මාලබේ විශ්ව විද්‍යාලය මහපොළ කැම්පස් ලෙස නම් කිරීම, නව ශ්‍රවණාගාරය ලලිත් ඇතුලත් මුදලි ශ්‍රවණාගාරය ලෙස නම් කිරීම හා මෙම නාම පුවරු පැහැදිලිව පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කිරීම කළ යුතු බව

5.1.4.9 4(ප) වගන්තිය - කාලය ඉකුත්වීම හේතුවෙන් හෝ වෙනත් ආකාරයකින් මෙම ගිවිසුම අවසන් වන අවස්ථාවේදී, භාර අරමුදල විසින් මූල්‍යයනය කරන ලද වත්කම් භාර අරමුදලෙහි දේපල ලෙස පැවතිය යුතු බව

5.1.5 2003 මාර්තු 19 වන දිනැති නෛතික ගිවිසුමට අනුව "මහපොළ කැම්පස්" නම් වූ අධ්‍යාපන ආයතනය පිහිටුවීමට හා එහි කළමනාකාරණය සඳහා ශ්‍රී ලංකා තොරතරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගමේ සේවය ලබා ගැනීමට හා ඒ සඳහා කළමනාකරණ ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා තොරතරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගමට

11 SEP 2018

"මහපොළ කැම්පස්" හි කිසිදු අයිතියක් නොමැති අතර නව නුවර පාර, මාළඹේ ප්‍රදේශයේ පිහිටි භාර අරමුදලට අයත් ඉඩම හා ගොඩනැගිලි ඇතුළු ඊට අයත් සියලු වත්කම්හි අයිතිය භාර අරමුදල සතු විය.

5.1.6 එසේ වුවද මුල් ගිවිසුම සැලකිය යුතු ලෙස වෙනස් කර 2005 නොවැම්බර් 14 දින ඇතිකර ගත් නව ගිවිසුම යටතේ භාර අරමුදලට අයත් භූමිය බදු කුලී පදනම මත SLIIT ආයතනයට බද්දට දී තිබූ අතර ගිවිසුමේ වගන්තිය අනුව වාර්ෂික බදු කුලිය ලෙස රු.8,000,000 හෝ SLIIT ආයතනය මාලඹේ කැම්පස්හි වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 20 යන අගයන් දෙකෙන් වැඩි අගය ගෙවිය යුතු බවට එකඟතාවයට පත්ව ඇත.

5.1.7 භාර අරමුදල හා SLIIT ආයතනය අතර 2003 මාර්තු 19 වන දින ඇතිවූ ගිවිසුමට අනුව විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් වූ සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ කිරීමේ අයිතිය භාර මණ්ඩලයට නියම වූ අතර විශ්ව විද්‍යාලයේ අභිවෘද්ධිය උදෙසා කරනු ලබන සියලු කටයුතු භාර අරමුදලේ එකඟතාවය මත සිදුකළ යුතු විය.එසේ වුවද භාර අරමුදල හා SLIIT ආයතනය අතර 2005 නොවැම්බර් 14 වන දින ඇතිවූ දෙවන ගිවිසුමට අනුව SLIIT ආයතනයෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව තීරණය කරනු ලබන ආකාරයට මෙම විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමටද ඒ අනුව වක්‍රලේඛ පිළියෙල කිරීම, විභාග පැවැත්වීම සඳහා සූදානම් කිරීම, සිසුන් බඳවා ගැනීම, අධ්‍යයන කාර්යය මණ්ඩලය සේවයේ යෙදවීම, කළමනාකරණය හා යටිතල පහසුකම් නඩත්තුව SLIIT ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි සිදුකිරීමට ද ප්‍රධාන ඉදිකිරීම්වලදී පමණක් භාර අරමුදලෙහි අනුමැතියට යටත්ව කටයුතු කිරීමට එකඟ වී තිබුණි. 2015 මැයි 12 දින නැවත ගිවිසුම් දෙකකට එළඹ තිබුණි. එනම් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගමට සිදුකරන ලද වියදම් ලෙස රු.373,579,392 ක ආයෝජන වටිනාකමට සරිලන මුදලක් නැවත අරමුදල වෙත ලබාදීම හා එමගින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම, භාර අරමුදලින් වෙන්වූ ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමට ඇති කරගත් ගිවිසුම හා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම අතර ඇති කරගත් කල්බදු ගිවිසුම වේ.

5.1.8 උක්ත ගිවිසුම් දෙක මගින් 2003 මාර්තු 19 වන දින ඇති කර ගත් මුල් ගිවිසුම හා 2005 නොවැම්බර් 14 දින ඇති කර ගත් ගිවිසුමෙන් භාර අරමුදලට වාසිසහගත වූ කොන්දේසි තවදුරටත් ඉවත් කර පහත සඳහන් නව කොන්දේසි එක් කර තිබුණි.

EDUC
11 SEP 2018
MAHAPOLA ★ FUND

5.1.8.1 භාර අරමුදල විසින් සිදුකළ ආයෝජන වටිනාකම ලෙස රු.373,579,392 ක් හා මහපොළ නමින් ලබාදුන් ශිෂ්‍යත්ව වටිනාකම සහ අනෙකුත් අනුෂාංගික වියදම් ආවරණය කිරීම සඳහා භාර අරමුදලට රු.408,500,000 ක මුදලක් ලබා දෙන බව

5.1.8.2 මහපොළ අරමුදල හා SLIIT ආයතනය අතර කිසිඳු මූල්‍යමය බැඳියාවක් නොමැති බව හා SLIIT ආයතනය මහපොළ අරමුදලින් වෙන්වූ ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාකරන බව

5.1.8.3 SLIIT ආයතනය කිසිඳු ගිණුම්කරණ ප්‍රමිතියකට, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියකට හෝ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතියකට යටත් නොවන අතර මහපොළ අරමුදල වෙත ගිණුම් වාර්තා ලබා දීමට හෝ 2015/2016 වර්ෂයේ සිට ගිණුම් ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවලින් නිදහස් කර ඇති බව

5.1.8.4 මහපොළ අරමුදලේ හිමිකාරිත්වය සතු SLIIT ආයතනය වෙත බදු දී ඇති මාළඹේ පිහිටා ඇති ඉඩම හෝ එහි කොටසක් උප බදු දීම, උකසට තැබීම සඳහා මහපොළ අරමුදලේ කිසිඳු ලිඛිත අවසරයක් අවශ්‍ය නොවන බව

5.1.8.5 SLIIT ආයතනයට ඔවුන්ගේ වියදමින් අදාළ භූමි පරිශ්‍රය තුළ ගොඩනැගිලි ඉදිකිරීම, යන්ත්‍රෝපකරණ සවිකිරීම හෝ අදාළ භූමිය ප්‍රතිසංස්කරණ, වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කිරීමට අවසර ලබා දී ඇති බව

## 5.2 සංවර්ධන ලොතරැයි මණ්ඩලය

භාර අරමුදල විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩයේ ආයෝජිත මුදල රු.2,200,000 ක් වූ අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික ලාභ ජනාධිපති අරමුදලට යවන අතර එයින් සියයට 50 ක ලාභ කොටසක් ජනාධිපති අරමුදල හරහා භාර අරමුදල වෙත වාර්ෂිකව ලබා දිය යුතු වේ.

## 5.3 නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ්

භාර අරමුදලට පූර්ණ අයිතිය සතු පරිපාලිත සමාගමක් වන මෙම සමාගමෙහි 2013 ජුනි 13 දින සාමාන්‍ය කොටස්වල ආයෝජනය කර තිබූ මුදල රු.200,000,000 ක් විය. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල හා මෙම සමාගම සමඟ 2003 නොවැම්බර් 18 දින එළඹ තිබුණු ගිවිසුමට අනුව රු.3,160,700,000ක් වූ අරමුදල් කළඹ කළමනාකරණය කිරීම මෙම සමාගමට පවරා තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට මෙම මුදල රු.8,345,078,695 ක් විය. මහපොළ භාර අරමුදල හා සමාගම අතර ඇතිකරගත් අරමුදල් කළමනාකරණ ගිවිසුමේ 2.1 වගන්තිය අනුව, මහපොළ භාර අරමුදල විසින් පත් කරන ලද ආයෝජන කමිටුව විසින් සියලු ආයෝජන තීරණ ගත යුතුය.

## 5.4 නැට්වෙල්ත් සෙකෙයුරිටීස් ලිමිටඩ්

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් මෙම සමාගමේ සාමාන්‍ය කොටස්වල සෘජුව ආයෝජනය කර නොතිබුණු අතර භාර අරමුදලෙහි පරිපාලිත සමාගම වූ නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් සමාගම විසින් එහි පූර්ණ අයිතිය සහිත පරිපාලිතයක් වශයෙන් ස්ථාපිත මෙම සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් සමාගම විසින් කරන ලද මුළු ආයෝජන වටිනාකම රු.1,175,000,070 කි. ඒ අනුව මෙම නැට්වෙල්ත් සෙකෙයුරිටීස් ලිමිටඩ් සමාගම භාර අරමුදලෙහි උප පරිපාලිත සමාගමකි. 2003 දී නැට්වෙල්ත් සෙකෙයුරිටීස් සමාගම ප්‍රාථමික ගැණුම්කරුවකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇත.

## 5.5 මහපොළ මංගත ලොතරැයිය

1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 6(2)(ඇ) වගන්තිය ප්‍රකාරව අරමුදලේ අරමුණු ඉටුකිරීමට අවශ්‍ය අරමුදල් රැස්කර ගැනීමේ අරමුණින්, 2013 ජූලි 11 දිනැති 13/0773/540/008 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත "මංගත ලොතරැයිය" 2013 ජූලි 30 දින නැවත ක්‍රියාත්මක කර තිබුණි.

## 5.6 වෙනත් ආයෝජන

මහපොළ භාර අරමුදල විසින් 2015 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල ආයෝජනය කර තිබූ මුදල රු.1,971,803,601 ක්වූ අතර එය 2017 දෙසැම්බර් 31 දින වන විට රු.1,516,360,695 දක්වා රු.455,442,906 කින් අඩු වී තිබුණි.

## 6. විගණන නිරීක්ෂණයන්

6.1 ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය යටතේ මහපොළ කැම්පස් පිහිටුවා එය කළමනාකරණය කිරීමේ කාර්යය සිදුකර භාර අරමුදලට සේවා දායකයෙකු ලෙස කටයුතු කිරීම වෙනුවට භාර අරමුදලට අයත් භූමිය භාවිතා කරමින් තම ව්‍යාපාර කටයුතු කර ගැනීමට හැකි පසුබිම නිර්මාණය කර ගැනීමට භාර අරමුදල විසින් SLIIT ආයතනයට අවස්ථාව ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

6.2 භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම එළඹි ගිවිසුම වරින් වර සංශෝධනය කිරීමෙන් මහපොළ කැම්පස්හි සම්පූර්ණ පාලනය SLIIT ආයතනය වෙත ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

11 SEP 2018

6.3 ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පිහිටුවා තිබුණත් එම ආයතනය සමඟ ඇතිකර ගත් ගිවිසුම් මෙසේ වරින් වර මහපොළ අරමුදලට අවාසිදායක ලෙස විශාල වශයෙන් වෙනස්කම් කිරීමේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

6.4 2003 මාර්තු 19 දින එළඹි ගිවිසුමේ 4 (ඔ) වගන්තිය අනුව 2017 වර්ෂය දක්වා භාර අරමුදලට ලැබිය යුතුව තිබූ ආදායම් රු. 1,845,785,181 ක් 2005 නොවැම්බර් 14 දින එළඹී ගිවිසුමෙන් අහිමිකර ගෙන තිබූ අතර 2005 එළඹි ගිවිසුම අනුව වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 20 හෝ රු.8,000,000 යන දෙකෙන් වැඩි අගය බදු කුළී වශයෙන් 2015 මැයි 12 දින වන විටත් අය කෙරෙමින් පැවතියද එදින වන විටත් හිඟ හිටි බදු කුළිය රු.79,493,672 ක් විය. මෙම හිඟ හිටි බදු කුළිය නොසලකා භාර අරමුදල සමාගම සමඟ නව ගිවිසුමකට 2015 මැයි 12 දින එළඹ තිබූ අතර එම ගිවිසුමට අනුව වාර්ෂිකව අය කළ යුතු බදු කුළිය රු.20,000,000 කට සීමා කර තිබීම හේතුවෙන් භාර අරමුදලට ලැබිය යුතු කුළිය 2015 දෙවන අර්ධ වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු. 120,990,448 කින් අඩු වී තිබුණි.

6.5 භාර අරමුදල විසින් වරින් වර ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගමේ ආයෝජනය කර තිබූ මුදල රු.373,579,392 ක් සහ භාර අරමුදල විසින් සමාගමට ලබා දී තිබූ ශිෂ්‍යත්ව වටිනාකම් හා අනෙකුත් අනියම් වියදම්වල මුළු වටිනාකම ලෙස රු.408,500,000 ක මුදලක් නැවත භාර අරමුදල වෙත නිදහස් කර තිබූ නමුත් එම මුදල වර්තමාන අගයට ගැලපීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

6.6 පහත ගිවිසුම් වලට එළඹීමෙන් පසුව 2015 වර්ෂයේදී මහපොළ භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල SLIIT ආයතනයේ කළ ආයෝජන ලෙස රු.1,064,520,695 ක් ගිණුම් ගත කර තිබූ අතර එය 2016 වර්ෂයේ දී ගොඩනැගිලි හා උපකරණ ගිණුමට මාරු කර වාර්ෂිකව 5% කින් ක්ෂය කර තිබුණි.

6.7 භාර අරමුදල හා එහි පරිපාලිත සමාගමක් වන SLIIT ආයතනය සමග ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

6.8 විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි ශිෂ්‍යයන් හට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපන දොරටු විවර කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම පිහිටු වුවද එහි ප්‍රතිලාභ ආර්ථික අපහසුකම් ඇති සිසුන්ට ලබා දී නොමැති බව නිරීක්ෂණය විය.

11 SEP 2018

6.9 සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් ජනාධිපති අරමුදල හරහා භාර අරමුදල වෙත ලැබිය යුතු ලාභ කොටසේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුලදී රු. 456,005,645 ක් ලාභය අඩුවෙන් භාර අරමුදල විසින් ලබාගෙන තිබුණි.

6.10 උසස් පෙළ අධ්‍යාපනය ලබන සිසුන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම වෙනුවෙන් 2014 හා 2015 යන වර්ෂවල පිළිවෙලින් රු.54,285,000 හා රු.43,785,000 ක් වැය කර තිබූ නමුත් එම ශිෂ්‍යත්ව සඳහා සිසුන් තෝරා ගන්නා පදනම, ශිෂ්‍යාධාර තීරණය කරනු ලබන ආකාරය හා වාර්ෂිකව ලබා දී තිබූ ශිෂ්‍යත්ව ප්‍රමාණය පිළිබඳ විස්තර භාර අරමුදල විසින් ලබා ගෙන නොතිබුණි.

6.11 භාර අරමුදලේ පරිපාලිත සමාගමක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සුරැකුම්පත් ගනුදෙනු තුළින් ප්‍රමාණවත් ප්‍රාග්ධන ප්‍රතිලාභ නොඉපයීම හා සමහර වර්ෂයන්හිදී සැලකිය යුතු අලාභයන් වාර්තා කර තිබුණි. 2011 සිට 2017 දක්වා විස්තර පමණක් පහත දැක්වේ.

| වර්ෂය | සුරැකුම්පත් ගණුදෙනු තුළින් උපයන ලද ප්‍රාග්ධන ශු.ලාභ/(අලාභ) |
|---|---|
| ------- | --------------------------- |
| | රු. |
| 2011 | 62,832 |
| 2012 | 8,279,168 |
| 2013 | 5,819,792 |
| 2014 | 14,774,097 |
| 2015 | (18,520,467) |
| 2016 | (102,941,528) |
| 2017 | 257,173 |

6.12 නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් විසින් කළමනාකරණය කරනු ලබන භාර අරමුදලේ ආයෝජන කළඹ 2016 ජනවාරි 01 දිනට රු.7,886,381,842 ක්ද මහපොළ භාර අරමුදල විසින් මෙම සමාගමේ ආයෝජිත ප්‍රාග්ධනය රු.985,500,070 ක්වූ අතර එකතුව රු.8,871,881,912 ක් විය. 2016 වර්ෂයේ ඉපයූ ආදායම රු.228,965,666 කි. ඒ අනුව ආයෝජනය මත ප්‍රතිලාභ අනුපාතය සියයට 2.58 ක් විය. එම වර්ෂයේ පැවති ස්ථාවර තැන්පතු සඳහා මහ බැංකු පොළී අනුපාතයේ සාමාන්‍ය සියයට 8.93 ක් විය. ඒ අනුව මෙම සමාගමේ මුදල් ආයෝජනය කිරීම නිසා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් උපයාගත හැකිව තිබූ රු.563,441,253 ක ආදායමක් 2016 වර්ෂයේ දී භාර අරමුදල අහිමි කරගෙන තිබුණි.

11 SEP 2018

6.13 2017 වර්ෂයේදී නැෂනල් වෙල්ත් කොපරේෂන් ලිමිටඩ් විසින් ආයෝජන කළඹ උපයෝගී කරගෙන සිදුකළ ප්‍රති මිලදී ගැනුම් ( Repo) ගණුදෙනු තුළින් රු.13,329,828 ක අලාභයක් ලබාගෙන තිබුණි.

6.14 2003 නොවැම්බර් 18 දින නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ ඇති කර තිබුණු අරමුදල් කළමනාකරණය සම්බන්ධයෙන් වූ ගිවිසුමේ 2.2 වගන්තිය අනුව පත්කළ අයෝජන කමිටුව ත්‍රෛයි මාසිකව රැස්වීම් පැවැත්විය යුතු වුවත් කමිටුව පත්කර ඇතත් රැස්වීම් පවත්වා නොතිබුණි.

6.15 2015 වර්ෂයේදී පරිපාලිත සමාගම් වූ නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගමෙන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගමෙන් පිළිවෙලින් රු.13,500,000 ක් හා රු.100,000,000 ක් ලාභාංශ ප්‍රකාශ කර තිබුණද එම ලාභාංශ භාර අරමුදලේ ලැබීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

6.16 2015 සහ 2016 වර්ෂ වලදී පිළිවෙළින් රු.200,242,875 ක් හා රු.499,181,284 ලෙස අලාභ ලබමින් පවත්වාගෙන ගිය නැට්වෙල්ත් සෙකෙයුරිටීස් සමාගමේ සමාන්‍ය කොටස්වල 2016 වර්ෂයේදි ද රු. 675,000,000 ක් ආයෝජනය කර තිබුණි.

6.17 නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම සුරැකුම්පත් ගණුදෙනු තුළින් ප්‍රමාණවත් ප්‍රාග්ධන ලාභ නොඉපයීම හා සමහර වර්ෂයන්හිදී සැලකිය යුතු අලාභයන් වාර්තා කර තිබුණි. 2011 සිට 2017 දක්වා විස්තර පමණක් පහත දැක්වේ.

| වර්ෂය | සුරැකුම්පත් ගණුදෙනු තුළින් උපයන ලද ප්‍රාග්ධන ශු.ලාභ/(අලාභ) |
|---|---|
| | රු. |
| 2011 | 86,494,376 |
| 2012 | (321,517,669) |
| 2013 | 58,692,200 |
| 2014 | 355,353,314 |
| 2015 | (77,827,715) |
| 2016 | (612,217,055) |
| 2017 | ( 73,231,266) |

DRAFT

11 SEP 2018

6.18 භාර අරමුදල විසින් නැට්වෙල්ත් සෙකෙයුරිටීස් සමාගමේ වරණීය කොටස්වල 2012 ජුනි 29 දින ආයෝජනය කර තිබුණු රු.200,000,000 ක් භාරකාර මණ්ඩලයේ හා ආයෝජන කමිටුවේ අනුමැතිය ලබා නොගෙන 2015 ජුනි 29 දින නිදහස් කර තිබුණි.

6.19 නැට්වෙල්ත් සෙකෙයුරිටීස් සමාගමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වර්ෂ 2008/2009, 2009/2010, 2010/2011, 2011/2012, 2013/2014 හා 2014/2015 සඳහා පිළිවෙලින් රු.24,136,857, රු.77,382,317, රු.84,378,708, රු.66,181,759 , රු.18,288,933 හා රු.113,687,212 ලෙස ආදායම් බදු තක්සේරු ලැබී තිබුණද එම බදු මුදල් ගෙවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේ නොගෙවීම හේතුවෙන් සියයට 50 ක් එනම් රු.182,905,481 ක දඩ මුදලක් ද ගෙවීමට තිබූ අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ද ඒ සඳහා වෙන්කිරීමක් කර නොතිබුණි.

6.20 ආයෝජන කළමනාකරණ ගිවිසුමේ 2.1 වගන්ති වලට පටහැනිව එම සමාගමේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂ හා ප්‍රධාන ගණුදෙනුකරු, ට්‍රිලියන් සිකියුරිටීස් පුද්ගලික සමාගම හා වර්වුවල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ට්‍රේඩින් ලංකා පුද්ගලික සමාගම නම් වූ පුද්ගලික සමාගම් 02 ක් සමඟ ප්‍රති මිලදී ගැණුම් ගණුදෙනු සිදුකිරීම සම්බන්ධයෙන් ආයෝජන තීරණ ගැනීමට 2013 හා 2014 වර්ෂවල සම්බන්ධ වී තිබුණි. පසුව මේ සම්බන්ධයෙන් සමාගම විසින් වෝහාරික විගණනයක් සිදුකර තිබුණ අතර මෙම වෝහාරික විගණන වාර්තාවට අනුව ඉහත නිලධාරීන් අවිධිමත් ගණුදෙනුවකට සම්බන්ධ වී තිබුණු බව අනාවරණය විය.

6.20.1 2017 වර්ෂය වන විටත් සමාගම විසින් සම්බන්ධිත පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

6.20.2 දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික ගණුදෙනුකරු) රීති අංක 11(2), 2009 ජුනි 24 දිනැති රීති අංක 01/2009 හා ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් (ප්‍රාථමික ගණුදෙනුකරු) රීති අංක 11(2) අනුව හිමිවන බලය යටතේ ඉහත සේවා යෝජකයන් දෙදෙනා සමග වූ ප්‍රධාන ප්‍රති මිලදී ගැණුම් ගිවිසුමට අනුව, ප්‍රතිමිලදී ගැණුම් ගණුදෙනු තුළින් ඇතිවන සියලු ගාස්තු උක්ත සේවා යෝජකයන් දෙදෙනාට නියමිත පරිදි ගෙවීමට උපදෙස් දෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2015 අගෝස්තු 07 දින සමාගමට නියෝගයක් නිකුත් කර තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම නියෝගය අවලංගු කර නොතිබුණු නමුත් සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි.

6.20.3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද මෙම නියෝගයට එරෙහිව සමාගම විසින් 2015 අගෝස්තු 18 දින අභියාචනාධිකරණයේ අභියාචනයක් ගොනුකර තිබුණු අතර 2015 සැප්තැම්බර් 04 දක්වා එම නියෝගය ක්‍රියාත්මක නොකරන ලෙස ප්‍රකාශ කරමින්

11 SEP 2018

අභියාචනාධිකරණය විසින් අතුරු නියෝගයක් නිකුත්කර තිබුණි. එසේ වුවද වගඋත්තර පාර්ශවකරුවන් සියලු දෙනා විසින් කරන ලද ඉල්ලීම සලකා බලා 2016 මාර්තු 29 දින උක්ත අතුරු නියෝගය අභියාචනාධිකරණය විසින් ඉල්ලා අස් කරගෙන තිබුණි. පසුව අභියාචනාධිකරණය විසින් ලබාදුන් තීන්දුව අභියෝගයට ලක් කරමින් 2016 අප්‍රේල් 18 දින මෙම සමාගම විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් අභියාචනයක් කර තිබූ නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමාගමට පක්ෂපාතිව කිසිඳු තීරණයක් ලබාදී නොතිබුණි. එහෙත් 2016 දෙසැම්බර් 27 දින වෝහාරික විගණන වාර්තාව සමාගම විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබාදී තිබුණි. එසේ වුවද 2018 වර්ෂය වන විටත් ශ්‍රී ලංකා මහ බැංකුව මේ සම්බන්ධයෙන් කිසිඳු නියෝගයක් සමාගමට ලබාදී නොතිබුණි.

6.21 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගම් 02 කට (වයිට් ග්‍රෝව් හෝල්ඩින්ග්ස් හා ඇස්ටුල් කැපිටල් හෝල්ඩින්ග්ස්) ගෙවන ලද රු.19,725,000 ක්වූ අවිධිමත් තැරව් ගාස්තු සම්බන්ධයෙන් නැට්වෙල්ත් සෙකෙයුරිටීස් සමාගම විසින් 2016 වර්ෂයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත්කර තිබුණි. මෙම සමාගම් මූල්‍ය සමාගම් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී තිබේද යන්න ගෙවීම කිරීමට පෙර සමාගම විසින් සනාථ කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6.22 මංගත ලොතරැයිය ක්‍රියාත්මක කිරීමේදී බලයලත් පාර්ලිමේන්තු පනත් දෙකක් අනුව පිහිටුවා ඇති ජාතික ලොතරැයි මණ්ඩලය හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් මෙම ලොතරැයිය ක්‍රියාත්මක කරවා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලා නොතිබුණි.

6.23 පළමු හා දෙවන අදියර යටතේ රු.බිලියන 6ක් ආයෝජනය කරමින් ලොතරැයිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජනකරුවෙකු තෝරා ගැනීම සඳහා සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යවරයාගේ යෝජනාවක් අනුව පස් දෙනෙකුගෙන් සමන්විත "මහපොළ ලොතරැයි කමිටුව'' නමින් විශේෂ කමිටුවක් 2012 අගෝස්තු 07 දින පත්කර තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.2 (ආ) වගන්තිය පරිදි ප්‍රසම්පාදන ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි.

6.24 ලංසු කැඳවීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1 පරිදි සම්මත ලංසු ලේඛන භාවිතාකර නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබීම හේතුවෙන් එම භාවිතාකර තිබුණු ලංසු ලේඛන තාක්ෂණ ඇගයීම් කමිටුවක් විසින් පරීක්ෂාකර අනුමත කර නොතිබුණි.

6.25 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 පරිදි ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවම වශයෙන් දින 21ක් ලබා දිය යුතු වුවද, දින 10 ක් පමණක් ලබාදී තිබීම හේතුවෙන් ලංසු 3ක් පමණක් ලැබී තිබුණි.

11 SEP 2018

6.26 ලංසු ඇගයීම් කමිටුවක් පත්කර නොතිබීම හේතුවෙන් විස්තරාත්මක ලංසු ඇගයීමක් සිදු නොකර ලොතරැයි කමිටුව විසින් ලංසු සැසඳීමක් පමණක් සිදුකර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 වගන්තිය අනුව, ලංසුකරුවන්ට තිබිය යුතු "සෘජුවම සුදුසු බව" යන සුදුසුකම ලංසු කැඳවීමේ අවශ්‍යතාවයට ඇතුළත් කළ යුතු වුවත් එය ඇතුළත් කර නොතිබියදී ඉදිරිපත්ව තිබූ ලංසු තුන අතුරින් පැහැදිලි තොරතුරු ඉදිරිපත් නොකළ බව සඳහන් කරමින් එක් ලංසුවක් ප්‍රතික්ෂේප තිබුණි.

6.27 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12 වගන්තිය පරිදි ඵලදායී තරඟකාරී බවක් නොමැති බව පැහැදිලිව පෙනෙන විට සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හැකියාව පැවතියද ඒ අනුව කටයුතු නොකර මාර්ගෝපදේශ 7.10 වගන්තියට පටහැනි ලෙස අනෙකුත් සම්පත්, මූල්‍ය තත්ත්වය හා පළපුරුද්ද නොසළකා ආයෝජනය කළ සමාගමකින් ඉදිරිපත් කළ ලංසුවක් සම්බන්ධයෙන් අදාළ සමාගම ඇගයීම වෙනුවට ප්‍රධාන ආයෝජකයෙකු වූ විදේශිකයෙකු ඇගයීමට ලක්කර තිබුණි. තවද අදාළ සමාගම ලියාපදිංචියේදී ලොතරැයිය ක්‍රියාත්මක කිරීම අරමුණක් ලෙස දක්වා නොතිබුණි.

6.28 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදයට අනුව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් පිළියෙල කළ යුතු වුවද තෝරාගත් ලංසුකරු විසින් ගිවිසුම පිළියෙල කර තිබුණි. එබැවින් "මහපොළ ලොතරැයිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ මූලික මෙහෙයුම් මාර්ගෝපදේශයේ" 6,8,9,14,15,16,17 හා 20 යන කරුණු ගිවිසුමෙන් ඉවත්කිරීම නිසා ලොතරැයියේ මෙහෙයුම් කටයුතුවල හා කාර්යසාධනයේ විනිවිදභාවයක් නොවීය.

6.29 භාර අරමුදල හා ලොතරැයිකරු සමග 2013 වර්ෂයේදී එළඹ තිබූ ගිවිසුමේ කොන්දේසි හා නියමයන්ට අනුව 2015 මැයි 05 සිට 2016 පෙබරවාරි 07 දින දක්වා කාලය සඳහා ලැබිය යුතු ලොතරැයි ආදායම රු.375,000,000 ක් හා එම මුදල හිඟ හිටීම නිසා අයවිය යුතු පොළිය රු.14,564,000 ක් අයකර ගැනීමට භාර අරමුදල කටයුතු කර නොතිබූ අතර එය ගිණුම්ගත කර නොතිබුණි. තවද 2016 පෙබරවාරි 08 සිට ගිවිසුම අවලංගු කළ දිනය වූ 2016 සැප්තැම්බර් 15 දින දක්වා අරමුදලට ලැබිය යුතු වාරික මුදල රු.298,913,043 ක් විය.

6.30 මෙම කොන්ත්‍රාත්තු ගිවිසුමේ 7.1(ආ) වගන්තිය අනුව කොන්ත්‍රාත් සමාගම වාරික මුදල් කාර්තුව ආරම්භ කරන දින හෝ එදිනට පෙර භාර අරමුදලට ගෙවිය යුතු විය. එසේ නොගෙවුවහොත් එදින සිට දින 90 ක් ඇතුළත කොන්ත්‍රාත්තරුට ඒ බව ලිඛිතව දැන්විය යුතු වුවද 2014 ජනවාරි 31 දින සිට 2016 නොවැම්බර් 15 දින දක්වා මුදල් ගෙවීම හිඟ හිට තිබූ නමුත් භාර අරමුදල විසින් ඒ බව ලිඛිතව දන්වා නොතිබුණි. එමෙන්ම එදින සිට දින 14 ක් ඇතුළත එනම් 2015 අගෝස්තු 17 දින ගිවිසුම අවසන් කළ යුතු වුවත් ගිවිසුම අවලංගු කර තිබුණේ 2016 සැප්තැම්බර් 15 දිනදීය. එබැවින් වසරකට වැඩි කාලයක් මහපොළ නම භාවිතා කර පෞද්ගලික සමාගමකට අතිප්‍රමාණික ලාභ ඉපැයීමට අවස්ථාව ලබා දී තිබුණි.

EDUCATION SC
REC
11 SEP 2018

6.31 2015 දෙසැම්බර් 31 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.455,442,906 ක්වූ ස්ථාවර තැන්පතු හා බැඳුම්කර කල්පිරීමේ දින එය නැවත ආයෝජනය කර ආදායම් උත්පාදනය කරනු වෙනුවට එම මුදල් මහපොළ ශිෂ්‍යත්ව ගෙවීමට හා දෛනික වියදම් පියවීම සඳහා වැයකර තිබුණි.

6.32 භාර අරමුදල පිහිටුවා වර්ෂ 29 ක් ගතවුවද එහි කාර්යාලය කුලී පදනම යටතේ ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන යන අතර ඒ වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2016 මැයි දක්වා රු.18,379,695 ක් කුලී වශයෙන් ගෙවා තිබූ අතර 2016 මැයි සිට නැවතත් රු.274,500 මාසික කුලියට ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයේ කොටසක අඩු ඉඩකඩ පහසුකම් සහිතව පවත්වාගෙන යනු ලැබේ.

6.33 අරමුදලේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර තිබුණද එහි ඉලක්ක ප්‍රමාණාත්මකව දක්වා නොතිබූ අතර කාර්යසාධන වාර්තා පිළියෙල කිරීමක්ද භාර අරමුදල විසින් සිදුකර නොතිබීම නිසා මහපොළ භාර අරමුදලේ ප්‍රගතිය ඇගයීමට නොහැකි විය.

## 07. පද්ධති හා පාලන දුර්වලතා

7.1 නිලධාරීන් හා සේවකයින් පත් කිරීම්, සේවයේ නියුක්ත කිරීම් පනතේ විධිවිධාන වලට යටත්ව සකස් කළ රීතිවලට අනුකූලව සිදු නොවීම.

7.2 තීරණ ගැනීමේදී භාරකාර මණ්ඩලය රැස් නොවී එක් භාරකරුවකුගේ අවශ්‍යතාව මත ගනු ලබන තීරණ අනෙකුත් භාරකරුවන් ලවා සහතිකකර ගැනීම.

7.3 ගණකාධිකාරී/ මූල්‍ය කළමනාකාරණ තනතුරක් නොමැති වීමෙන් අරමුදලේ ගණුදෙනු ගිණුම් තැබීම ක්‍රමවත්ව සිදු නොවීම හා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සිදු නොවීම.

7.4 ආයෝජන ප්‍රතිලාභ ඇගයීම් නිසිපරිදි සිදු නොකිරීම හා පරිපාලිත සමාගම් අධීක්ෂණය නිසි පරිදි සිදු නොවීම.

7.5 ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව කටයුතු නොකිරීම.

7.6 ආයෝජන ඇගයීමේ කමිටු ක්‍රියාත්මක නොවීම.

## 08. නිර්දේශ

8.1 මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ සඳහන් විධිවිධාන මැනවින් අධ්‍යයනය කර අරමුදලේ කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීමට අවශ්‍ය නිවැරදි තීරණ ගැනීම භාරකාර මණ්ඩල රැස්වීම්වලදී බහුතරයේ එකඟතාවය මත සිදුකළ යුතු බවට නිර්දේශ කෙරේ. (නිරීක්ෂණ ඡේද වලට යොමුව 6.1, 6.2, 6,3)

8.2 පහත සඳහන් පරිදි භාර අරමුදල පනතේ සංශෝධනයන් කාලීනව සිදුකළ යුතු බවට නිර්දේශ කෙරේ.

8.2.1 අරමුදලේ කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී මුදල් රෙගුලාසි සංග්‍රහය ආයතන සංග්‍රහය, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා වරින් වර නිකුත් කරන අනිකුත් රජයේ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළයුතු බවට (නිරීක්ෂණ ඡේද වලට යොමුව 6.23,6.24, 6.25,6.25,6.26,6.27,6.28,6.29,6.30 )

8.2.2 භාර අරමුදල බාහිර පාර්ශවයන් සමඟ ගිවිසුම්වලට එළඹීමේදී හා එළඹ තිබූ ගිවිසුම්වල කොන්දේසි විශාල වශයෙන් වෙනස්කිරීම් සිදුකිරීමේදී කැබිනට් මණ්ඩල අනුමැතියකින් සිදුකළ යුතු බවත් දැනට අරමුදලට අවාසිදායක කොන්දේසි සහිත ගිවිසුම් අහෝසිකර භාර අරමුදලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකි පරිදි නව ගිවිසුම්වලට එළඹීම. (නිරීක්ෂණ ඡේදයට යොමුව 6.4 )

8.3 භාර අරමුදලේ ආදායම්, වියදම්, වත්කම්, වගකීම් වලට අදාළ සියලුම ගණුදෙනු නිසි පරිදි ගිණුම් තැබීම, පොත්පත් පවත්වාගෙන යාම හා මූල්‍ය පාලනය සඳහා මූල්‍ය කළමනාකරුවෙකු හා පරිපාලනය සඳහා වගකිව යුතු තනතුරු ඇතිකර සංවිධාන ව්‍යුහය සංශෝධනය කළ යුතු බවට නිර්දේශ කෙරේ. (නිරීක්ෂණ ඡේද වලට යොමුව 6.7, 6.8, 6.15)

8.4 භාර අරමුදලේ ආයෝජන සහ ප්‍රතිලාභ ඇගයීම සඳහා පත්කළ කමිටුව ත්‍රෛමාසිකව රැස්වී ආයෝජන ඇගයීම් කටයුතු කළයුතු බවත් ඒ පිළිබඳ භාරකාර මණ්ඩල රැස්වීම්වලදී පරීක්ෂා කිරීමත් සිදුකළ යුතුබවත් නිර්දේශ කෙරේ. (නිරීක්ෂණ ඡේද වලට යොමුව 6.11, 6.12, 6.13, 6.14)

8.5 අරමුදලේ ආයෝජන හා ශිෂ්‍යත්ව ලබාදීම ඇතුළු සියලු ක්‍රියාකාරකම් ඇතුළත්ව ක්‍රියාකාරී සැලැස්මක් වාර්ෂිකව පිළියෙළ කළයුතු බව හා වාර්ෂිකව කාර්යසාධන වාර්තා සකස්කර ප්‍රගතිය පරීක්ෂා කළයුතු බවටත් නිර්දේශ කෙරේ. (නිරීක්ෂණ ඡේද වලට යොමුව 6.33)

8.6 භාර අරමුදලේ කාර්යාලය සුදුසු නිශ්චිත ස්ථානයක පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතුබව නිර්දේශ කෙරේ. (නිරීක්ෂණ ඡේද වලට යොමුව 6.32)

8.7 භාර අරමුදල යටතේ පවතින පරිපාලිත සමාගම් වල සිදුකළ ආයෝජනයන් හා ආයෝජන කළඹ කළමනාකරණය පිළිබඳ විධිමත් අධීක්ෂණයක් නිරන්තරයෙන් සිදුකළ යුතු බව නිර්දේශ කෙරේ. (නිරීක්ෂණ ඡේද වලට යොමුව 6.13, 6.14)

## 09. නිගමන

9.1 මහපොළ භාර අරමුදලට ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සම්බන්ධයෙන් තිබූ අධිකාරිත්වය හා රු.1,645,494,236 ක ප්‍රතිලාභ අහිමිවීම සඳහා භාරකරුවන් වගකිව යුතුබව නිගමනය කරමි.

9.2 සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික ලාභයෙන් භාර අරමුදලට ලැබිය යුතු සියයට 50ක ලාභ කොටස රු.456,005,645 ක් අඩුවෙන්ලබාදීම සම්බන්ධයෙන් ජනාධිපති අරමුදලේ නිලධාරින්ද, ඒ පිළිබඳ පරීක්ෂා කර හිමි මුදල ලබා නොගැනීම සම්බන්ධයෙන් භාර අරමුදලේ අධ්‍යක්ෂකද වගකිව යුතුබව නිගමනය කරමි.

9.3 භාර අරමුදලට පූර්ණ අයිතිය සතු නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම හා එහි පරිපාලිත සමාගමක් වූ නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් සමාගම සුරැකුම්පත් ගණුදෙනු තුළින් 2011,2015,2016 හා 2017 යන වර්ෂවලදී එකතුව රු.1,206,225,700 ක අලාභ වාර්තා කිරීම සම්බන්ධයෙන් එම සමාගම්වල කළමනාකරුවන් වගකිව යුතුබව නිගමනය කරමි.

9.4 මංගත ලොතරැයිය ක්‍රියාත්මක කිරීම සඳහා නුසුදුසු ලොතරැයිකරුවකු තෝරාගැනීම නිසා භාර අරමුදලට අහිමි කළ රු.688,477,043 මුදල සඳහා ලොතරැයිකරු තෝරා ගැනීම සඳහා දායක වූ ප්‍රසම්පාදන කමිටුව, ඇගයීම් කමිටුව හා ලොතරැයිකරු වගකිව යුතුබව නිගමනය කරමි.

9.5 මහපොළ භාර අරමුදල සතු ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර සුරැකුම්පත්වල ආයෝජිත මුදල නැවත ආයෝජනය නොකිරීම නිසා භාර අරමුදල සතු ආයෝජන රු.455,442,906 කින් අඩුවීම සම්බන්ධයෙන් භාරකරුවන් සහ අධ්‍යක්ෂවරයා වගකිව යුතුබව නිගමනය කරමි.

විගණකාධිපති

11 SEP 2018

ඇමුණුම 01

## ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගමේ පාලන මණ්ඩලය

| | නම | තනතුර | නිත්‍ය සේවා ස්ථානය |
|---|---|---|---|
| 01. | ඇන්ටන් ඇල්ෆ්‍රඩ් මයා | ලේකම් | අභ්‍යන්තර හා අන්තර්ජාතික වෙළඳ හා ආහාර අමාත්‍යාංශය |
| 02. | මහාචාර්ය සමරජීව කරුණාරත්න මයා | උපකුලපති | මොරටුව විශ්ව විද්‍යාලය |
| 03. | මහාචාර්ය ලොයිඩ් ලක්ෂ්මන් රත්නායක මයා | ප්‍රධානී - ඉංජිනේරු පීඨය | මොරටුව විශ්ව විද්‍යාලය |
| 04. | තිලාන් මන්ජිත් විජේසිංහ මයා | සභාපති | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය |
| 05. | තෙලිකඩ පල්ලියගුරුගේ නන්දසිරි ලීලාරත්න මයා | උපදේශක | අභ්‍යන්තර හා අන්තර්ජාතික වෙළඳ හා ආහාර අමාත්‍යාංශය |
| 06. | ආචාර්ය බමුණුවිට ගමගේ ලලිත් දීප්ති කුමාර මයා | අධ්‍යක්ෂ | පරිගණක සේවා මධ්‍යස්ථානය, මොරටුව විශ්ව විද්‍යාලය |
| 07. | රොනල්ඩ් ආමන්ඩ් පාවුල් ගුණතිලක මයා | සභාපති | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය |
| 08. | තේනුවර හන්නාදිගේ රන්ජිත් තේනුවර ද සිල්වා මයා | ප්‍රධාන ගණකාධිකාරි | අභ්‍යන්තර හා අන්තර්ජාතික වෙළඳ හා ආහාර අමාත්‍යාංශය |

DRAFT

11 SEP 2018

ඇමුණුම 02

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචියෙන් පසු නව පාලන මණ්ඩලය

| | නම | ලිපිනය |
|---|---|---|
| 01. | මහාචාර්ය ලලිත් දීප්ත කුමාර මයා | 46, වැලිකඩ පාර, නාවල, රාජගිරිය |
| 02. | සෙනරත් විදානලාගේ දොං කේසරලාල් ගුණසේකර මයා | 4, ද සේරම් පාර, ගල්කිස්ස |
| 03. | මහාචාර්ය සමරජීව කරුණාරත්න මයා | 36, ද ෆොන්සේකා පෙදෙස, කොළඹ 3 |
| 04. | ආචාර්ය සමන් ප්‍රියන්ත කුමාරවඩු මයා | 1043,පොතු ආරාම පාර, මාළඹේ |
| 05. | තෙලිකඩ පල්ලිය ගුරුගේ නන්දසිරි මයා | 146/9, කල්දේරා ගාඩ්න්ස්, දුටුගැමුණු වීදිය, කළුබෝවිල, දෙහිවල |
| 06. | මහාචාර්ය ලොයිඩ් ලක්ෂ්මන් රත්නායක මයා | 274A, පරණ කොට්ටාව පාර, ඇඹුල්දෙණිය, උඩහමුල්ල, නුගේගොඩ |
| 07. | රත්නායක මුදියන්සේලාගේ කරුණාරත්න මයා | රක්ෂණ මන්දිරය, වොක්ෂෝල් වීදිය |
| 08. | කාවන්තිස්ස දනුද්‍ර වීරවර්ධන මයා | 4, 28 වන පටුමග, ඔෆ් ෆලවර් පාර, කොළඹ 07 |
| 09. | තිලිණි බණ්ඩාර තෙන්නකෝන් මිය | 6, සුදුහුම් පොළ, නුවර |
| 10. | රංජිත් තේනුවර ද සිල්වා මයා | 93, 5 වන මාවත, සිද්ධමුල්ල |
| 11. | තිලාන් මන්ජිත් විජේසිංහ මයා | 29/8, ගිල්ඩ් ෆෝඩ් ක්‍රෙසන්ට්, කොළඹ 07 |

DRAFT